සන්නස SANNASA

**සංස්කරණය / Editors**
ජගත් ජේ එදිරිසිංහ Jagath J Edirisinghe
editor@sannasa.com.au
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සහය සංස්කරණය / Asst Editor**
අසෝක සිල්වා Asoka Silva

**ග්‍රැෆික් නිර්මාණ කරනය**
**Graphic Design by Crystal D**
Digital Agency
www.crystald.com.au

**රූ රටා**
අතුල කල්දෙමුල්ල

**සේයා රූ**
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න

**සම්බන්ධීකරණය**
**New South Wales**
ලක්ෂමන් කොඩිතුවක්කු
**Queensland**
ආනන්ද සමරතුංග
**Canberra**
අසෝක නිමලසිරි

**සන්නස පිරිවර**
සාලිය ගලප්පත්ති
සිසිර දිසානායක
ලක්ෂමන් කොඩිතුවක්කු
වික ධර්මබන්ධු
මහින්ද දිසානායක දිවුල්ගනේ

**වෙළඳ දැන්වීම් / Advertising**
**Dilki : 0426 959 540**
info@sannasa.com.au
www.sannasa.com.au

**Sannasa Bank Account Details**
**Acc Name:**
Sannasa Media Group
**BSB:** 033 137 **AC:** 626 670

සන්නස පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා, ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සළකන්න.



# ජනාධිපතිවරයා මේ රට අශීලාචාර රටක් කළා

**ඔක්තෝබර් මස 31 වන දින කෝට්ටේ සොලිස් උත්සව ශාලාවේදී පැවති ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වෘත්තිකයෝ සංවිධානය විසින් සංවිධානය කරන ලද ප්‍රවෘත්ති සාකච්ඡාවේදී**

නැවත වතාවක් ජනාධිපතිධූරය දැරීමේ ආශාවෙන් ජනාධිපතිවරයා පෙළෙනවා. තමන් හොරා කියලා හංවඩුගහපු, තමන් මිනිමරුවා කියලා හංවඩුගහපු, හිටපු ජනාධිපතිවරයාගේ පිරිසක් තමයි අද ජනාධිපතිවරයාට ඕන වෙලා තියෙන්නේ නැවත ජනාධිපතිධූරයට පත්වීම සඳහා. මේ වගේ අශිෂ්ඨ දේශපාලනයකටද අපි මේ රට ගෙනියන්නේ

මම මේ ජනාධිපතිවරයාට ඡන්දය දීලා තියෙනවා 2015 දී. අපි ඡන්දය දුන්නේ මේ රටේ යහපාලනය ක්‍රියාත්මක කිරීම සඳහා. මම මෙතනදී ව්‍යවස්ථාව හෝ නීතිය පිළිබඳව කතා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මම මෙහි දේශපාලන කාරණය ගැන තමයි කතා කරන්න බලාපොරොත්තු වෙන්නේ.

**මේ රටේ මොන ආණ්ඩුව තිබුනත් අපිට ප්‍රශ්නයක් නැහැ. හැබැයි මේ රටේ නීතියේ පාලනය තියෙන්න ඕන.**

ව්‍යවස්ථානුකූලභාවය තියෙන්න ඕන. ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා වෙන්න ඕන. අපි මෙතනට ආවේ පහුගිය සතියේ ඇති වෙච්ච මේ රටේ නීතියේ පාලනය සම්පූර්ණයෙන් බිඳ වැටුනා. ඒ වගේම මේ රටේ ශීලාචාරකම බිඳ වැටුනා. ඒක අවුරුදු තුනහාමාරක් ඇතුළත ජනාධිපතිවරයා දුන්නු පොරොන්දු අමු අමුවේ උල්ලංඝණය කෙරුවා. එතුමා ජාතික අමතා කරපු කතාව තුළත් අපිට විශාල විමතියක් ඇති වුනා, එතුමා අලුත් හොරෙක් ගැන කතා කලා. ඒ තමා රනිල් වික්‍රමසිංහ. එතුමා 2015 දී හිටපු ජනාධිපතිවරයා හොරෙක් කෙරුවා. එතෙකොට එතුමා අලුත් හොරාව අයින් කරලා නැවතත් පරණ හොරා ගාවටද ගියේ. මම මේ කතා කරන්නේ එතුමාගේ වචන වලින්. ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ වචනවලින් මම මේ කියන්නේ. අලුත් හොරෙක් නම් රනිල් වික්‍රමසිංහ මහතා එතුමා කියපු විදියට පරණ හොරා තමයි වර්තමානයේ අගමැතිවරයා හැටියට පත් කරපු මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපති-වරයා. ඒ පත්වීම නීත්‍යානුකූල නොවන නිසා තමයි අපි ආවේ මෙතනට. එතකොට අපි 2015 මේ පෙරළිය කළේ මේ රටේ 62 ලක්ෂයකට වැඩි ජනතාවක් ඡන්දය පාවිච්චි කරලා. මේ රටේ නීතියේ පාලනය ඇති කරන්නත්, ශීලාචාරකම ඇති කරන්නත්. දැන් අපි දැක්කා 2015ට කලින් මේ රට තුළ තිබුනු තත්ත්වය. ඉතින් ඒ තත්ත්වයට එරෙහි තමයි බලවේගයක් ඉස්මතු වුනේ. විශේෂයෙන් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය නැවත තහවුරු කිරීම. මානව අයිතිවාසිකම් තහවුරු කිරීම. පුවත්පත් සහ මාධ්‍ය නිදහස තහවුරු කිරීම. මේවා තමයි එදා සටන් පාඨ වුනේ. ඒ වගේම නීත්‍යනුකූලභාවය පාලනය. ව්‍යවස්ථානුකූලභාවය. මේ සියළු පොරොන්දු දීලා තමයි යහපානය විනිවිදභාවය, විවෘතභාවය, වගකීම, වගවීම යන යහපානයේ මූලධර්ම එක්ක තමයි මේ රජය බලයට පත් වෙන්නේ. ඒකේ නියමුවා තමයි ජනාධිපතිවරයා.



**ජ්‍යෂ්ඨ කථිකාචාර්ය ටෙරන්ස් පුරසිංහ**
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

නමුත් අපිට පේනවා පහුගිය සතියේ සිදුවුනු දේවල් වලින් එතුමාම යහපාලන-යේ මූලධර්ම උල්ලංඝණය කරනවා. හොර රහසේ අගමැතිවරයට පාර්ලිමේන්තුවේ බහුතරයක් තිබියදීත්, හොර රහසේ වෙනත් අගමැතිවරයෙක් පත් කරලා. දැන් කැබිනට් මණ්ඩලයකුත් දිවුරුම් දෙනවා. ඒ වගේම මන්ත්‍රීවරුන්ව විකිණෙන තත්ත්වයක් ඇති-වෙලා තියෙනවා. මේ රටේ ජනතාවට යන කලදසාව කුමක්ද? අපි දැක්කා පහුගිය දින කිහිපයේදී මන්ත්‍රීවරු මුදලට විකිණිච්ච හැටි. ඇමති පදවිවලට විකිණිච්ච හැටි. මේ රටේ ඡන්ද තියන්න ඕන නැනේ. මේ රටේ මැතිවරණ තියන්න ඕන නෑ. මේ රටේ මන්ත්‍රීවරුන් එහාට මෙහාට කරලා ආණ්ඩු ගෙනියන්න පුළුවන්නේ. මහජනතාවගේ විශාල මුදල් සංඛ්‍යාවක් වැය කරලා ඡන්ද පවත්වන්නේ. අපි ඡන්ද දීලා තියෙන්නේ 2015 අගෝස්තු මාසයේ පාර්ලි-මේන්තු මන්ත්‍රීවරු පත් කරලා තියෙන්නේ. මේ රටේ ජනතා පරමාධිපත්‍යය නියෝජනය කරන්න. දැන් ඒ මන්ත්‍රීවරු එක පිල් වලට පනිමින් මේ රටේ ජනතා පරමාධිපත්‍යයට නින්දා සහගත තත්ත්වයක් ඇති කරලා තියෙනවා. අන්න ඒකට විරුද්ධව තමයි අපි මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්න තමයි අපි මේ ගමන ආරම්භ කරලා තියෙ-